**ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස රු.114,008,097 ක් දක්වා තිබුණත්, විගණනයට ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.113,905,010 ක් වී තිබුණි. ඒ අනුව රු.103,087 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව ගිණුම් ගතකළ යුතුය. | වෙනසක් නිරීක්ෂණය නොවේ. |
| (ii) | ඉහත (අ)(i) ඡේදය ප්‍රකාරව වූ විගණන නිරීක්ෂණය හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.103,087 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව ගිණුම් ගතකළ යුතුය. | වෙනසක් ගිණුමේ නොමැත. |

**(ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තොරතුරු අනුව දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම රු.2,209,003,732 ක් වී තිබුණි. නමුත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.2,034,406,144 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.174,597,588 ක වෙනසක් අනාවරණය විය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සියලු මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස භූමි 03 ක රු.4,720,000 ක වටිනාකම දෙවරක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ ඉදිකරන ලද ගොඩනැගිලි හා ඉදිකිරීම්වල වටිනාකම රු.89,874,143 ක් වී තිබුණත්, එය රු.23,603,115 ක් අඩුවෙන් රු.66,271,028 ක් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iv) | දෙපාර්තමේන්තු පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2015 හා 2017 වර්ෂවලට අදාළව නිරවුල් නොකළ එකතුව | මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පොත් සමඟ සසඳා | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| රු.382,556 ක් වූ හර ශේෂ හා 2016 වර්ෂයට අදාළ නිරවුල් නොකළ රු.123,300 ක් වූ බැර ශේෂ භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නොතිබුණි. | ශේෂ නිරවුල් කළ යුතුය. | |

**(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ වටිනාකම ලෙස රු.2,674,911,932 ක් දක්වා තිබුණි. භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම, තැන්පත් ලැබීම් හා වෙනත් ලැබීම් වටිනාකම්වල එකතුව රු.2,747,975,512 ක් වී තිබුණි. ඒ අනුව රු.73,063,580 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ දක්වා ඇත. |
| (ii) | භාණ්ඩාගාරය වෙත යවා තිබුණු රු.50,000,000 ක් භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම යටතේ දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | මාසික ගිණුම් සාරාංශ අනුව භාණ්ඩාගාරයට යවා ඇති අතර එය භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම යටතේ පෙන්වා ඇත. |
| (iii) | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ණය ආපසු ලැබීම් වටිනාකම රු.49,475,341 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. | භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම යටතේ පෙන්වා ඇත. |
| (iv) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ණය වශයෙන් | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 | භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම යටතේ පෙන්වා ඇත. |

ගෙවා තිබුණු රු.58,817,145 දරන රාජ්‍ය ගිණුම්
ක් ආයෝජන චක්‍රලේඛයේ උපදෙස්
ක්‍රියාකාරකම්වලින් ජනිත වූ පරිදි මූල්‍ය ප්‍රකාශන
මුදල් ප්‍රවාහ යටතේ දක්වා පිළියෙල කළ යුතුය.
නොතිබුණි.

### 1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය පවත්වා තිබුණු දින තුන සඳහා ප්‍රදර්ශන භූමියට විදුලිය සැපයීම වෙනුවෙන් රු.33,582,527 ක් ගෙවා තිබුණි. එම වියදමට ඇතුළත් එකතුව රු.22,724,451 ක් වූ වියදම් සනාථ කර ගැනීම සඳහා වාහන ධාවන සටහන්, චෙක්රෝල්, බිල්පත් යනාදී සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 137 හා 139 ප්‍රකාරව අදාළ සාක්ෂි ලබාගත් පසු වියදම් අනුමත කිරීම හා සහතික කිරීම සිදු කළ පසු ගෙවීම් කළ යුතුය. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් එම කාර්යයන් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව මිලට ගන්නා ලද භාණ්ඩ යොදාගත් බව දන්වා තිබුණි. |
| (ii) | 2018 වර්ෂයේ රුහුණු කතරගම සහ කොටබෝව කුඩා කතරගම දේවාලවල වාර්ෂික ඇසළ උත්සවයේ අතිරේක විදුලි පහසුකම් සැපයීම සඳහා ආරක්ෂක විදුලි ලාම්පු යෙදීමට රු.14,664,834 ක් ගෙවා තිබුණි. ඊට අදාළ විස්තරාත්මක වියදම් ඇස්තමේන්තු, බිල්පත් හෝ වියදම් තහවුරු කෙරෙන වෙනත් ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 137 හා 139 ප්‍රකාරව අදාළ සාක්ෂි ලබාගත් පසු වියදම් අනුමත කිරීම හා සහතික කිරීම කළ පසු ගෙවීම් කළ යුතුය. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු අනුව ගෙවීම් සිදුකර ඇත. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණකාධිකාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2.3 වගන්තිය | 182,475 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා සාද නිවාස වලින් නව තක්සේරු වාර්තා අනුව කුලී අය කර නොතිබුණි. | නව තක්සේරු වාර්තා අනුව හිඟ කුලී මුදල් අයකළ යුතුව ඇත. | පළාත් තක්සේරු දෙපාර්තමේන්තු වෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(4) රෙගුලාසිය | 2,697,350 | 2018 ඔක්තෝබර් 02 දින සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී මාස 6 ½ කට අධික කාලයක් ගත වී තිබුණද, පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(04) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අලුත්වැඩියාව සම්බන්ධයෙන් අවසන් බිල්පතක් ඉදිරිපත් කර නොමැති බැවින් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. |

### 1.6.4 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.253,623 ක එකතු කළ අගය මත බදු මුදල් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණද, බදු ගෙවන දිනය වන විට කොන්ත්‍රාත්කරුවන් සක්‍රීය බදුකරුවන් බව සනාථ කෙරෙන නිෂ්කාශන සහතික ලබාගෙන නොතිබුණි. | එකතු කළ අගය මත බදු ගෙවීමට ප්‍රථම සක්‍රීය බදුකරුවෙකු බව සනාථ කර ගැනීමට නිෂ්කාශන සහතිකය ලබාගත යුතුය. | ඉදිරියේදී එම සහතික ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ii) | "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ප්‍රදර්ශන භූමිය අභ්‍යන්තරයේ තාවකාලික වැට ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු මිල කියුමේ එකතු කළ අගය මත බදු පිළිබඳ | කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී එකඟ වූ වටිනාකම පමණක් ගෙවිය යුතුය. | අදාළ කොන්ත්‍රාත්කරු වැට් බදු සඳහා ලියාපදිංචි වී ඇත. |

සඳහන් කර නොතිබුණද, ගෙවීම් කිරීමේදී එකතු කළ අගය මත බදු ලෙස රු.136,950 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එළඹ තිබුණු බැරකම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන් වියදම් කළ පසු ඉතිරිය රු.83,316 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දුනිමි. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ජනාධිපති ලේකම් කාර්යාලය** | | |
| (i) | බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "ග්‍රාම ශක්ති වැඩසටහන" යටතේ ග්‍රාම නිලධාරී වසම් දෙකක ප්‍රතිලාභීන් 48 දෙනෙකු සඳහා රු.499,200 ක් වැයකර මී මැසි පෙට්ටි හා උපකරණ බෙදාදී තිබුණි. ප්‍රතිලාභීන් 35 දෙනෙකුට ලබා දී තිබුණු මී මැසි පෙට්ටිවල මී මැසි ජනපද නොතිබුණු බව ක්ෂේත්‍ර නිලධාරීන් විසින් වාර්තා කර තිබුණි. | මී මැසි ජනපදය ලබාදීමේ අරමුණ ඉටුවන පරිදි රජයේ අරමුදල් ඵලදායීව උපයෝජනය කළ යුතුය. | ස්වභාවික පරිසරයේ සිදුවන වෙනස් වීම් නිසා මී මැසි ජනපද ඉවත්වී ඇත. |
| (ii) | බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "දිවිසර ප්‍රජා ඵලදායීතා වැඩසටහන - 2017" යටතේ බිම්මල් | ව්‍යාපෘතිය ඉටුකිරීම පිළිබඳව පරීක්ෂාකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත | මෙම ප්‍රතිලාභියාද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර |

| | | | |
|---|---|---|---|
| | වගා ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිලාභියෙකුට රු.163,090 ක් ගෙවා තිබුණද, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | යුතුය. | ඇත. |
| (iii) | “ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර” වැඩසටහනේ කාර්යයන් වෙනුවෙන් ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා මාසිකව රු.3,000 ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනා ගෙවිය හැකි වුවද, ඊට අනුකූල නොවී කතරගම, වැල්ලවාය සහ තණමල්විල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිලධාරීන් 10 දෙනෙකුට එකතුව රු.189,000 ක මාසික දීමනාවක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට ගෙවීමේදී ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතුය. මෙම ගෙවීම සඳහා ආයතන අධ්‍යක්ෂගේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට නොහැකිවන්නේ නම් වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ගේ අංක එම්ඕ/ඩීඑස්/ඩීපීඑස්/ඩී /02/04 දරන හා 2018 සැප්තැම්බර් 04 දිනැති ලිපිය අනුව ගෙවීම් සිදු කර ඇත. |

**(ආ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

-------------------------------------

සියඹලාණ්ඩුව සහ බිබිල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ “මොනරාගල දිස්ත්‍රික් ඵලදායීතා සංවර්ධන වැඩසටහන - 2017” ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.21,517,286 ක් වියදම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 161 කට ලබා දී තිබුණු රු.3,676,168 ක් වූ භාණ්ඩ ප්‍රතිලාභීන් විසින් අදාළ කාර්යයන් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ පසු, පසුවිපරම් කටයුතු සිදු කළ යුතුය. | ප්‍රතිලාභීන් සමඟ ඇති කරගත් ගිවිසුම් අනුව ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 239 දෙනෙකුට ලබාදී තිබුණු සෙවිලි තහඩු 3824 ක් ප්‍රයෝජනයට ගෙන තිබුණු බව තහවුරු කරගෙන නොතිබුණි. වැසිකිළි ආධාර ලබාදී තිබුණු ප්‍රතිලාභීන් 198 දෙනෙකු සඳහා, ප්‍රතිලාභියකුට ලබාදිය යුතු බ්ලොක් ගල් 125 ක ප්‍රමාණය ලබා නොදී අනෙකුත් භාණ්ඩ ලබා දී තිබීම | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ පසු, පසුවිපරම් කටයුතු සිදු කළ යුතුය. | පිළිගනිමි. |

| | | |
|---|---|---|
| හේතුවෙන් වැසිකිලි ඉදිකිරීම සිදුකර නොතිබුණි. | | |

**(ඇ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

| | | |
|---|---|---|
| විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ බිබිල සහ බුත්තල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2016 හා 2017 වර්ෂවල මිලදී ගෙන තිබුණු රු.1,167,345 ක භාණ්ඩ 2019 මැයි 14 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාල වකවානු තුළ ප්‍රතිලාභීන්ට මිලදී ගත් භාණ්ඩ බෙදා දිය යුතු අතර, ඒ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් ලේඛන පවත්වා ගත යුතුය. | භාණ්ඩ බෙදා දී අවසන් කර ඇත. |

**(ඇ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

| | | |
|---|---|---|
| බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී තිරසර කෘෂි වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 20 දෙනෙකුට වාරික 10 කින් ආපසු අයකර ගැනීමේ පදනම මත රු.132,000 ක් වටිනා උපකරණ ලබා දී තිබුණි. අදාළ වාරික මුදලින් රු.101,400 ක් ආපසු අයකර ගෙන නොතිබුණි. | අයකර ගත යුතු වාරික අදාළ පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2.3 තැන්පත්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 69.19 ක් වී තිබුණි. එම ශේෂයෙන් රු.මිලියන 8.36 ක තැන්පත් ශේෂ වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණත්, එම ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිගනිමි. |

**2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු කේවල ණය ශේෂවල එකතුව රු.2,838,818 ක් වූ අතර එම හිඟ හිටි ණය ශේෂය තුළ වූ වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් අයනොවී පවතින ණය ශේෂය රු.2,413,983 ක් වී තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල වී පහත සඳහන් අවශ්‍යතාවයන් හා තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.<br>(i) සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය<br>(ii) අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර<br>(iii) වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan)<br>(iv) ක්‍රියාත්මක කළ කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම /ප්‍රතිඵල<br>(v) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම | චක්‍රලේඛ විධිවිධාන හා මගපෙන්වීම්වලට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. | ඉදිරියේදී චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දුනිමි. |

(vi) සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
(vii) අභ්‍යන්තර විගණන සැලැස්ම

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

විගණනයට ඉදිරිපත් කළ වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 44,276 ක සිට 44,907 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. 2017 වර්ෂයේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 44,875 ක් වී තිබුණි. විවිධ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණද, සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සැලකිය යුතු අඩුවීමක් සිදුවී නොතිබුණි. | ඵලදායී ලෙස ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. | සමෘද්ධි ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් පරිදි කටයුතු කරමි. |

**3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ප්‍රදර්ශනය සඳහා රු.මිලියන 68.25 ක් වැයකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | | |
| (i) ප්‍රදර්ශනය පැවති භූමිය සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් යොදාගෙන තිබුණු වාහන හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් රු.මිලියන 14.34 ක් වැයකර තිබුණි. යන්ත්‍ර සූත්‍ර ධාවනය කළ පැය ගණන, වාහන ධාවනය කළ දින ගණන තහවුරු කර ගැනීම සඳහා අධීක්ෂණ නිලධාරීන්ගේ තහවුරුව සහිතව ප්‍රවාහන වැඩ පත්‍රිකා(Job Card) විගණනයට | ගෙවීම් කිරීමට ප්‍රථම ගෙවීම් තහවුරු කිරීමට අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ හා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමේදී වැඩ පත්‍රිකා පිළිබඳව අවධානය යොමු කළ යුතු බවට නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් නොකිරීම නිසා එම වියදම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | | |
| (ii) | ප්‍රදර්ශන භූමියේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය රු.මිලියන 2.06 ක් වැයකර නිමකර තිබුණි. ඉදිකිරීම් කටයුතු නිමකර මාස 05 ක් ගතවීමටත් ප්‍රථම, මාර්ගය සඳහා ආලේප කර තිබුණු තාර ගැලවී වලවල් සෑදී තිබුණි. | ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට අනුකූලවන පරිදි ඉටුකරන ආකාරයට අධීක්ෂණයන් ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු වලදී ගුණත්වය හා කල් පැවැත්ම පිළිබඳ අවධානය යොමු කර කටයුතු කරමි. |
| (iii) | ප්‍රදර්ශන භූමිය සකස් කිරීමට යෙදීම සඳහා හියුම් පයිප්ප 143 ක් හා ඊට අදාළ කොලර් 60 ක් සඳහා රු.මිලියන 1.6 ක් වැයකර තිබුණි. 2019 ජනවාරි 10 දින වන විට ප්‍රදර්ශනය අවසන් වී මාස පහකට අධික කාලයක් ගත වී තිබුණත්, එම පයිප්ප හා කොලර් නිෂ්කාර්යව පැවතුණි. | නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීම හා දැනට ඉතිරිව පවතින කොලර් හා හියුම් පයිප්ප සුදුසු සංවර්ධන කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතුය. | පිළිගනිමි. |
| (iv) | ප්‍රදර්ශණ භූමියේ පොකුණක් ඉදිකිරීම සඳහා රු.මිලියන 2.84 ක් වැයකර තිබුණද, එය ඉදිකර මාස පහක් ගත වීමට පෙර, පොකුණ ස්ථාන කිහිපයකින් කැඩී ක්‍රමයෙන් හානියට පත්ව විනාශ වී තිබුණි. | ප්‍රදර්ශණය සඳහා කරනු ලබන ඉදිකිරීම් ප්‍රදර්ශණය අවසන් වීමෙන් පසුව වෙනත් කාර්යයකට යොදා ගැනීමට හැකිවන පරිදි සැලසුම් කළ යුතුය. | මෙම පොකුණ ප්‍රදර්ශනය වෙනුවෙන් තාවකාලිකව ඉදිකර ඇත. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවල වැඩ කොටස් අඩුවෙන් ඉටුකර තිබීම, වැරදි මිල ගණන් භාවිතා කර තිබීම, මාර්ග මිල ගණන් උපලේඛනයේ සඳහන් උපදෙස් අනුව කටයුතු නොකිරීම, ප්‍රමාද ගාස්තු අය නොකිරීම සහ රජයට වාසිදායක ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම යනාදි නිරීක්ෂණ නිසා කොන්ත්‍රාත්කරුවන් වෙත එකතුව රු.මිලියන 4.07 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති නිමකර භාර ගැනීමේදී විධිමත් පරිදි අදාළ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. | වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සිදු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2017" යටතේ පෙර පාසල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.491,973 ක් වැයකර තිබුණි. 2017 සැප්තැම්බර් 22 දින වන විට එම ඉදිකිරීම් කටයුතු නිම කර තිබුණද, 2019 ජනවාරි 23 දින වන විටත් එම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු නිම නොකිරීමෙන් පරිශ්‍රය තුළ වල් බිහිවී නිෂ්කාර්යව පැවතුණි. | ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේදී ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, මාර්ග 02 ක් වැඩි දියුණු කිරීම සඳහා රු.218,700 ක් වැයකර තිබුණි. එම වියදම් මාර්ග මිල ගණන් උපලේඛනයේ (HSR) උපදෙස්වලට පටහැනිව හා යන්ත්‍ර වැඩකිරීමේ සටහන් ආකෘති අනුව තහවුරු කර ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. | මාර්ග ඉදි කිරීමට අදාළ රජයේ රෙගුලාසිවලට අනුව ගෙවීම් කළ යුතුය. | පිළිගනිමි. |
| (ඉ) | බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන - 2017" යටතේ උඩමැල්ලැහැව ගම්මානයේ ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා රු.96,432 ක් වැය කර ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදී තිබුණද, අදාළ ඉදිකිරීම් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිරන්තරව අධීක්ෂණය පවත්වා ගත යුතුය. | ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් රු.50,000 ක මුදලක් ගොවි සංවිධානයෙන් මේ වන විට අයකර ඇත. |
| (ඊ) | බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "2017 දක්ෂිණ කලාපීය සංවර්ධන වැඩසටහන" යටතේ 10 කණුව සුභසාධක සමිති ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රීට් තට්ටුව (Slab) දැමීමට කම්බි සඳහා රු.133,701 ක් සහ එහි සැටලිම සඳහා රු.86,938 ක් වැයකර තිබුණි. 2019 මැයි 14 දින වන විටත් එම කාර්ය ඉටුකර නොතිබුණි. | සම්පූර්ණ ඉදිකිරීම නිම වන පරිදි ඇස්තමේන්තු සකස් කර ඒ සඳහා ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගනිමි. |
| (උ) | බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් | ව්‍යාපෘතිය | ගබඩා ටැංකියේ සිට නල |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලය විසින් “2017 දක්ෂිණ කලාපීය සංවර්ධන වැඩසටහන” යටතේ ඇත්තලාමුල්ලගම බුබුල ආශ්‍රිතව ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා රු.1,970,122 ක් වැයකර ව්‍යාපෘතිය නිමකර තිබුණි. 2019 මැයි 14 දින වන විට ව්‍යාපෘතිය නිමකර වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද, ප්‍රතිලාභීන්ට ජල පහසුකම් සපයා නොතිබුණි. | ඉටුකිරීමෙන් පසුව අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | එළා අවසන් කර ඇත. |
| (ඌ) | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් “වැවක් සමඟ ගමක් වැඩසටහන - 2018” යටතේ කරවිලේ ප්‍රජාශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ගොඩනැගිල්ලේ ඇතුළත පී.වී.සී. (PVC) සිවිලිම සපයා සවිකිරීම වෙනුවෙන් රු.220,924 ක් වැය කර තිබුණි. සිවිලිම වහලයට සවිකිරීම සඳහා මිලි මීටර් 40 ප්‍රමාණයේ GI චැනල් (GI Channels) භාවිතා කළ යුතු වුවද, එසේ නොකර ඒ සඳහා ඉතා කුඩා ප්‍රමාණයේ කම්බි භාවිතා කර තිබුණි. ඇස්තමේන්තුව අනුව සිවිලිම සඳහා පී.වී.සී. (PVC) සිවිලිම් ෂීට් භාවිතා කළ යුතු වුවද, එම වර්ගයේ සිවිලිම් ෂීට් භාවිතා කර නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් මිල ගණන් (BSR) හි සඳහන් රේටයන්ට අදාළ පිරිවිතර අනුව ගෙවීම් කළ යුතුය. | පිළිගනිමි. |
| (එ) | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් “විමධ්‍යගත අයවැය වැඩසටහන - 2018” යටතේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මාර්ග හතරක වීථි පහන් 68 ක් සවිකිරීම වෙනුවෙන් රු.194,000 ක් වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවා තිබුණද, වීථි ලාම්පු සවිකර නොතිබුණි. | වියදමට අදාළ ප්‍රතිලාභ මහජනතාවට ලබා දීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | වීථි ලාම්පු සවිකිරීමට කටයුතු සිදු කරමින් පවතී. |
| (ඒ) | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදනවලින් රු.1,998,693 ක් වැයකර ඉදිකර තිබුණු ආයුර්වේද | වියදමට අදාළ ප්‍රතිලාභ මහජනතාවට ලබා දීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | ගොඩනැගිල්ලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | සංරක්ෂණ සභාව සඳහා වූ නව ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | | |
| (ඔ) | තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහවැව ප්‍රදේශයේ නිලසෙවන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 හා 2018 වර්ෂවලදී රු.2,431,786 ක වියදම් කර තිබුණි. එම වියදමට සමරු ඵලකයක් ඉදිකිරීම වෙනුවෙන් රු.15,000 ක් ඇතුළත් ව තිබුණද, සමරු ඵලකයක් ඉදිකර නොතිබුණු අතර ගොඩනැගිල්ලද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නිම කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. ගොඩනැගිල්ල විවෘත කර අපේක්ෂිත අරමුණ ඉටු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | අපේක්ෂිත අරමුණු සඳහා යෙදවීමට කටයුතු කරමි. |
| (ඕ) | සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ බිම්මල් වගාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.433,276 ක් වැයකර තිබුණි. ඉදිකිරීම් කටයුතු නිමකර තිබුණද, බිම් මල් වගා කටයුතු ආරම්භ කර නොතිබුණි. | වියදමට අදාළ ප්‍රතිලාභ මහජනතාවට ලබා දීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | මේ වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව දන්වා ඇත. |
| (ක) | සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2018 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ මහගම බේකරි මාවතේ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අගල් 2 විදුලි මෝටරයක් සහ ස්ටාටරයක් මිලදී ගැනීමට රු.206,000 ක් වැය කර තිබුණි. අදාළ කාර්යය නිම නොකර මිලදී ගෙන තිබුණු භාණ්ඩ ප්‍රතිලාභියකුගේ නිවසේ තබා තිබුණි. | වැය කළ වියදමට අදාළ ප්‍රතිලාභ මහජනතාවට ලබා දීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කර්මාන්තයෙන් අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට හැකි වනු ඇත. |
| (ග) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක බල ප්‍රදේශ තුළ ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,220,000 ක මූල්‍ය ප්‍රතිපාදන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී තිබුණද, ඒවා | අනුමත සංවර්ධන යෝජනා සඳහා අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිපාදන විධිමත් පරිදි උපයෝජනය කර | ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක නොවීමට හේතු වූ කරුණු දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක කර නොතිබුණි. | මහජනයාගේ අපේක්ෂාවන් ඉටු කළ යුතුය. | |

### 3.4 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------ |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව වෙළපොළ මිල සැඳහුම් ක්‍රමය භාවිතා කර ප්‍රසම්පාදනය කළ හැකි භාණ්ඩ හා සේවාවල වටිනාකම රු.1,000,000 ක් වී තිබුණි. එම සීමාව ඉක්මවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් එකතුව රු.මිලියන 5.81 ක ප්‍රසම්පාදනයන් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ප්‍රසම්පාදනයන් ඉටු කළ යුතුය. | පිළිගනිමි. |
| (ආ) | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, සංවර්ධන ව්‍යාපෘති දෙකකට අදාළව ලීටර් 20 යාන්ත්‍රික දියර ඉසින යන්ත්‍ර 66 ක් මිලදී ගැනීම සඳහා අවස්ථා දෙකකදී ලබා දුන් ප්‍රසම්පාදන තීරණ දෙකක් පදනම් කරගෙන තිබුණි. ඉන් දෙවන අවස්ථාවේදී ලබා දී තිබුණු වැඩි මිල මත මිලදී ගැනීමට තීරණ කිරීම නිසා රු.100,300 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කළ යුතුය. | දෙවන වර මිල ගණන් කැඳවීමේදී දිවයිනේ ප්‍රවීන ආයතන කෙරෙහි අවධානය යොමු කර කටයුතු කර ඇත. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.දෙලක්ෂයකට වැඩි වාහන අලුත්වැඩියා කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. එසේ අනුමැතිය ලබා නොගෙන, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.373,182 ක් ගෙවා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ උපදෙස් පරිදි කටයුතු කරමි. |

තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2008 සහ 2009 වර්ෂවලදී "ජාතික සවිය ගමනැගුම" විශේෂ ව්‍යාපෘතිය යටතේ රු.3,922,914 ක් වියදම් කර ඉදිකරන ලද ජනසභා කාර්යාල ගොඩනැගිල්ල අරමුණුගත කාර්යය සඳහා යොදා නොගෙන, ස්වාභාවික ආපදාවන්ට ලක් වෙමින් පැවතුණි. 2018 මාර්තු 22 දින රැස්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 148 වන රැස්වීමේදීද මෙම ගොඩනැගිල්ල ඵලදායී ලෙස යොදාගැනීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පෙන්වා දී තිබුණද, එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. | නිෂ්කාර්යව පවතින රජයේ ගොඩනැගිලි අරමුණු ගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. | ගොඩනැගිල්ලෙහි වහලය අලුත්වැඩියා කිරීමෙන් පසු සහකාර සැලසුම් අධ්‍යක්ෂවරයාගේ නිල නිවස සඳහා භාවිතා කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගණකාධිකාරීගේ රජයේ නිවාසය පරිගණක පුහුණු පාඨමාලාවක් පවත්වාගෙන යාම සඳහා විධිමත් අනුමැතියකින් තොරව හා ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයකට ලබාදී රජයේ වත්කම් අවභාවිතා කර තිබුණි. ඒ සඳහා කුලී අයකිරීමද කර නොතිබුණි. | රජයේ වත්කම් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු අතර, අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් රජයේ වත්කම් භාවිතා කිරීම වැළැක්විය යුතුය. | ඉදිරියේදී මෙම ආයතනය සමඟ ගිවිසුම්ගත වී මුදල් අයකරන බව දන්වමි. |
| (ඇ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් ජල බවුසරයක් වසර හතරකට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ නවතා තිබුණි. අදාළ | කඩිනමින් යථාතත්ත්වයට පත්කර ඵලදායි කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ | මෝටර් රථ පරීක්ෂක විසින් නිර්දේශ ලබාදීමෙන් පසුව ලැබෙන උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | අලුත්වැඩියාවන් සිදුකර එළදායී කටයුත්තක යොදවා නොගෙන එම වත්කම දිරාපත් වීමට ඉඩහැර තිබුණි. | යුතුය. | |

## 3.6 පාඩු හා හානි

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයකට සිදුවී තිබුණු අලාභයෙන් සියයට 25 ක් වූ රු.30,893 ක් රියදුරුගේ විශ්‍රාම පාරිතෝශිතයෙන් අයකළ යුතු බවට පූර්ණ වාර්තාවේ සඳහන් කර තිබුණද, 2019 මැයි 14 දින වන විටත් එම පාඩුව අයකර ගෙන නොතිබුණි. | පූර්ණ වාර්තාවේ නිර්දේශයට අනුකූලව අලාභය අයකර ගත යුතුය. | අදාළ මුදල ගෙවන ලෙස රියදුරුට දන්වා ඇත. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක වාහන 02 කට සිදුවී තිබුණු එකතුව රු.මිලියන 3.38 ක් පොත්වලින් කපා හැරීම සඳහා මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණත්, 2019 මැයි 14 දින වන විට ඒ සඳහා අනුමැතිය ලබා දී නොතිබුණි. | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන පොත්වලින් කපා හැරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | එක් අනතුරක් සම්බන්ධයෙන් ගොනුව වසා දැමීමට අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා ඇත. අනෙක් අනතුර සම්බන්ධයෙන් ගොනුවේ කටයුතු අවසන් කර ඇත. |
| (ඇ) | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2002 සැප්තැම්බර් 19 දින අනතුරට පත්ව තිබුණු අතර, මුදල් රෙගුලාසි 104(4) වාර්තාව අනුව රු.375,000 ක් රියදුරුගෙන් අයකිරීමට තීරණය කර තිබුණි. මෙම අලාභය රියදුරුගෙන් අයකර ගන්නා ලෙස 2013 අප්‍රේල් 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී නියෝග කර තිබුණද, එම නියෝගය ලබාදී වර්ෂ 06 කට අධික කාලයක් ගත වී තිබුණත් එම අලාභයෙන් රු.300,000 ක් අයකර | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව ක්‍රියා කළ යුතුය. | ඉතිරි මුදල් අයකරන මෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. |

නොතිබුණි.

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 දෙසැම්බර් 11 දිනැති අංක MO/RG/301 දරන තක්සේරු වාර්තාවට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස සඳහා එම තක්සේරු කුලිය අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2018 අගෝස්තු 31 දිනට අයවිය යුතු හිඟ නිවාස කුලිය රු.1,359,575 ක් වී තිබුණි. | නව තක්සේරු වාර්තාවට අනුව නිල නිවාස සඳහා හිඟ කුලී අයකිරීම සිදුකළ යුතුය. | හිඟ නිවාස කුලී පියවා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | 2010 වර්ෂයේ සිට 2014 ජනවාරි මාසය දක්වා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීගේ රජයේ නිවාසයේ පදිංචි වී සිටි ගණකාධිකාරීවරයාගෙන් රු.117,634 ක කුලී මුදල් අඩුවෙන් අයකර තිබුණු අතර, ඉන් රු.97,634 ක් තවදුරටත් හිඟ හිටව පැවතිණි. | සම්පූර්ණ හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එක් සේවා ස්ථානයක සේවය කළ හැකි උපරිම කාල සීමාව වර්ෂ 05 කි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක සේවයේ | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ස්ථාන මාරුවීම් සිදු කළ යුතුය. | වාර්ෂික ස්ථාන මාරු සඳහා සියලුම කාර්යය මණ්ඩල තොරතුරු අදාළ ආකෘති පත්‍ර මඟින් අමාත්‍යාංශය වෙත වාර්තා කරනු ලැබේ. |

නියුතු නිලධාරීන් 127 දෙනෙකු වර්ෂ 06 ක සිට වර්ෂ 27 ක් දක්වා කාල පරාසයක් තුළ එකම සේවා ස්ථානයේ යොදවා ගෙන තිබුණි.